**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492**

**ආයතනයේ නම : ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණය හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක :- 492**
**ආයතනයේ නම :- ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

**පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.**

## පළමු කොටස :79.00

| වාර්තාව මගින් හඳුනාගත් අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වත්මන් තත්වය |
|---|---|
| අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | 2023 වර්ෂය සඳහා අවදානම් ලේඛනයක් පවත්වා නොමැති අතර 2024,2025 යන වර්ෂ සඳහා අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි. |
| විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණු අවස්ථා වාර්තා විය. | මෙම විගණන විමසුම් සඳහා පහත කාල වකවාණු තුළ පිළිතුරු සපයා ඇත.<br><br>**විගණන විමසුම** — **පිළිතුරු සැපයූ දිනය**<br><br>I) මත්ස්‍ය නිෂ්පාදනය, මත්ස්‍ය ප්‍රමිතිය ඉහළ නැංවීම සඳහා 50% සහනාධාර යටතේ බහුදින ධීවර යාත්‍රා ලබාදීම. — 2024/06/11<br>II) වෙරළාසන්න මුහුදේ කෘතිම සමුද්‍ර පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම. — 2025/01/21<br>III) කළපු සංවර්ධන වැඩසටහන යටතේ කළපු සීමා ලකුණු කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ පරීක්ෂාව. — 2024/03/04<br>IV) මීගමු දිස්ත්‍රික් ධීවර කාර්යාලය -විගණන පරීක්ෂාව — 2024/12/19<br>V) දියවර දිරිය ණය යොජනා ක්‍රමය-අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම 2011 — 2025/08/13<br>VI) හලාවත කළපුවේ කළපු සීමා ලකුණු කිරීම සඳහා මායිම් කණු සිටුවීමේ පරීක්ෂාව. — 2024/06/24<br>VII) 2025 තෙවන කාර්තුවට අදාල ඇගයීම් වාර්තා — 2024/03/01<br>VIII) ධීවර ත්‍යාග අරමුදලේ 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශණ ඇතුලත්ව එහි කටයුතු පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) |

| | |
|---|---|
| | වගන්තිය ප්‍රකාරව විස්තරාත්මක කළමණාකරන විගණන වාර්තාව. — විගණනය සඳහා පිළිතුරු සපයා නොමැත.<br><br>තවද මේ වන විට අදාල කාල වකවාණු තුළ සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයිම සිදු කරන බව දන්වා සිටිමි. |
| අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | මෙම විගණන විමසුම් සඳහා පහත කාල වකවාණු තුළ පිළිතුරු සපයා ඇත.<br><br>**විගණන විමසුම** — **පිළිතුරු සැපයූ දිනය**<br><br>I) ක්‍රියාවලි පරික්ෂාව පිළිබඳ විගණන වාර්තාව — 2025/06/19<br>II) මන්නාරම් දිස්ත්‍රික් ධීවර කාර්යාලය විගණන පරික්ෂාව -2023 — 2024/11/26<br>III) කල්මුණෙ දිස්ත්‍රික් ධීවර කාර්යාලය විගණන පරික්ෂාව -2023 — 2025/10/07<br>Iv) කුවිතාන්සිපත් නිකුත් කිරීම (පොදු 176) — 2024/02/14<br><br>තවද මේ වන විට අදාල කාල වකවාණු තුළ සියළුම විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයිම සිදු කරන බව දන්වා සිටිමි. |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිලිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ත්‍රියාත්මක කර නොතිබුණි. | 2023 වර්ෂයේ කාර්යමණ්ඩල හිඟය සහ ඉන්ධන අර්බුදය වැනි හේතු මත නියමිත කාල වකවාණු තුළදී භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අතර මේ වන විට භාණ්ඩ සමීක්ෂණයට අදාළ නිර්දේශයන් , වෙන්දේසි කටයුතු ආදිය මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත කාල වකවාණු වලදී සිදු කරමින් පවතී. |
| සියළු වාහන වල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | 2026.03.10 දින වන විට සියළු වාහන වල රාජ්‍ය ලාංඡන පිත්තාරු කර ඇත. |
| බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි. | හඳුනා නොගත් ලැබීම් තුළ අන්තර්ගත රු195,500.00 ක මුදල සෘජුවම බැංකුගත කරන ලද ලැබීම් වන අතර ,එම ලැබීම් පහත පරිදි නිරවුල් කර ඇත. |

| | |
|---|---|
| | දිනය රිසිට් අංක මුදල (රු) නිරවුල් කළ මාසය<br><br>2023. 07.18 U.I.R/07/18 30,000 2024 ජූනි මාසය<br>2023.08.02 U.I.R/08/02 5,000 2024 අගෝස්තු මාසය<br>2023.08.09 U.I.R/08/09 75,000 2024 අගෝස්තු මාසය<br>2023.09.01 U.I.R /09/01 500 2024 ජූනි මාසය<br>2023.09.11 U.I.R/09/11 35,000 2024 ජූනි මාසය<br>2023.10.13 U.I.R/10/13 10,000 2024 ජූනි මාසය<br>2023.10.27 U.I.R/10/27 40,000 2024 ජූනි මාසය<br>-----------<br>195,000<br>======= |
| මු.රෙ.94 (1) ප්‍රකාරව වැය විෂයකට සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබිණි. | මින් ඉදිරියට එවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන ලෙස අදාල නිළධාරීන් දැනුවත් කරන ලදී. |
| වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | වැටුප් අංක 5668 දරණ සංවර්ධන නිලධාරියාගෙන් අයවිය යුතු ආපදා ණය ශේෂයෙන් රු.123,776.59 ක මුදලක් මේ වන විට අයකරගෙන ඇත.තවදුරටත් අයවිය යුතු රු.16,023.41 ක ශේෂය පියවන ලෙස අදාල ඇපකරු වෙත 2026.03.27 දින ලිපිය මගින් දැනුවත් කර ඇත. |
| පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | **6000-0-0-16-0-47**<br>විස්තරය මුදල(රු) නිරවුල් කළ මාසය<br><br>I) Ceylon Fishery Harbour Corporation 23.614.70 2024 අගෝස්තු<br>II) Pio Fiber Glass Industries 38,200.05 2024 අගෝස්තු<br>III) Chief engineer De.of Building Baticaloa 22,974.05 2025 ජනවාරි<br>IV) President Mannar Distric 43,623.97 2024 අගෝස්තු<br>V) MPS construction 19,341.08 2025 ජනවාරි<br>VI) Chief Engineer De.of Building Baticaloa 17,842.25 2025 ජනවාරි<br>VII) MPS Construction 8,301.63 2025 ජනවාරි<br>VIII) MPS Construction 14,465.13 2025 ජනවාරි<br>XI) Eco Engineers 157,700.00 2025 ජනවාරි |

---------------
**346,062.86**
========

**6000-0-0-16-0-64**

| විස්තරය | මුදල(රු) | නිරවුල් කළ මාසය |
|---|---|---|
| I) S.L.රිහාන් ඇතුළු පස් දෙනා සහනාධාර ක්‍රමය යටතේ ඉතිරි මුදල | 12,531.00 | 2024 මාර්තු මස රජයේ ආදායමට බැර කරන ලදී |
| II) W.A.නුවන් ප්‍රනාන්දු සහනාධාර ක්‍රමය යටතේ ඉතිරි මුදල | 14,982.64 | 2024 මාර්තු මස රජයේ ආදායමට බැර කරන ලදී |
| III) B.S.K.පෙරේරා | 26,250.00 | 2024 මාර්තු මස රජයේ ආදායමට බැර කරන ලදී |
| IV) R.P.සුමිත් ප්‍රියන්ත | 41,666.00 | 2024 මාර්තු මස රජයේ ආදායමට බැර කරන ලදී |
| V) K.ක්‍රිෂ්ණා මූර්ති | 3,077.32 | 2024 මාර්තු මස රජයේ ආදායමට බැර කරන ලදී |
| VI) සහකාර අධ්‍යක්ෂ-කළුතර | 98,482.84 | 2024 අගෝස්තු මස රජයේ ආදායමට බැර කරන ලදී |
| VII) නලින් චමිල | 9,000.00 | 2024 අගෝස්තු මස රජයේ ආදායමට බැර කරන ලදී |
| VIII) සහකාර අධ්‍යක්ෂ -ත්‍රිකුණාමලය | 42,069.00 | 2024 මාර්තු මස නිරවුල් කර ඇත. |
| IX) සහකාර අධ්‍යක්ෂ -හලාවත | 2,711,535.00 | 2024 මාර්තු,අප්‍රේල් මස නිරවුල් කර ඇත. |
| X) South Eastern Economic Development | 5,000,000.00 | * |
| XI) මහේස්ත්‍රාත් අධිකරණය පුත්තලම | 66,900.00 | 2024 අගෝස්තු මස රජයේ ආදායමට බැර කරන ලදී. |
| | ----------------- | |
| | **8,026,493.80** | |
| | =========== | |

* South Eastern Economic Development (Y M Yaseer) ට අදාල රු5,000,000.00 ක තැන්පතුව, බෝට්ටු අංක IMUL-A-0062 KMN වෙනුවෙන් අදාළ ප්‍රතිලාභියා විසින්

| | |
|---|---|
| | තැන්පත් කරන ලද මුදලක් වන අතර එම බෝට්ටුවේ නිෂ්පාදන කටයුතු මෙතෙක් අවසන් නොමැති බැවින් එම මුදල ද රඳවා තබා ගන්නා ලදී. |
| සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ පැවති ශේෂය අදාල චක්‍රලේඛ විධිවිධාන අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නියමිත දිනට ප්‍රේෂණය කොට නොතිබිණි. | 2023 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කල වටිනාකම හා මූල්‍ය ප්‍රකාශනයෙහි ඒ.සී.ඒ.03 ආකෘතියෙහි මුදලින් පියවීම් අතර දක්නට ලැබෙන රු117,000.00 ක වෙනස මගින් පෙන්නුම් කරනු ලබනුයේ 2023 වර්ෂයේ දෙපාර්තමේන්තු ආදායම් රැස් කිරීමේ නිළ බැංකු ගිණුමට සෘජුවම බැරවූ රු117,000.00 හඳුනා නොගත් ලැබීමකි. මෙම වෙනස හඳුනාගෙන මේ වන විට නිවරදි කර ඇත. |
| මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිමය කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබිණි. | සියළු නිලධාරින් දැනුවත් කරන ලදී. මේ වන විට මු.රෙ.371 ප්‍රකාරව කටයුතු කරමින් පවති. |

**දෙවැනි කොටස : 38.00**

| වාර්තාව මගින් හදුනාගත් අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වත්මන් තත්වය |
|---|---|
| ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හදුනාගෙන නොතිබිණි.හදුනා ගත් තිරසර අරමුණු ඉටුකර ගැනිම සඳහා ළගා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබිණි.හදුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබිණි. | 2023 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව තුළ ඉහත දර්ශක දක්වා නොතිබුනද එය හදුනාගෙන 2025,2026 වර්ෂයට සකස් කල කාර්ය සාධන වාර්තා වල නිවරදිව දක්වා ඇත. |
| ආයතනයේ පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබිණි . | පුරවැසි ප්‍රඥප්තිය අධීක්ෂණය සඳහා අතිරේක අධ්‍යක්ෂක ජනරාල් පත්කර ඇත.සමහර කාර්යයන් මාර්ගගත ක්‍රමවේද අනුව ත්‍රියාත්මක කිරීම හඳුන්වාදෙන බැවින් ඒ අනුව පුරවැසි ප්‍රඥප්තිය 2026 වසරේ යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවති. |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්ම පිලියෙල කර නොතිබුණි.සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.සැලැසුම් පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමානය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.සැලැසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි. | 2024,2025,2026 වර්ෂ සඳහා මානව සම්පත් සැලැස්ම සකස් කර ඇත.තවද කාර්ය සාධන ගිවිසුම් ද සකස් කර ගිවිසුම් ගත වී අවසන්ව ඇත. |

| | |
|---|---|
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය , යටත්ව මට්ටමේ/ව්‍යාවන මට්ටමේ /අහිතකර මට්ටමේ විය. | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය ව්‍යාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ නොවන අතර 2023 වර්ෂය සඳහා තත්ත්වාගණනය කළ මතයක් ලබා දී ඇත. |
| 2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.01 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටු කළ යුතු කාර්යභාරය පැහැදිළි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හදුනාගෙන නොතිබුණි. | ප්‍රගතිය මැනිම සඳහා කාර්ය සාධක දර්ශක හඳුනා ගැනිමේදී සංඛ්‍යාත්මක හා ගුණාත්මක දත්ත පදනම් කර ගනී.සංඛ්‍යාත්මක දත්ත පදනම් කර ගැනිමේදී ප්‍රතිශතාත්මක වශයෙන් ඉදිරිපත් කරණ අතර , ගුණාත්මක දත්ත පදනම් කර ගැනිමේදී ඒවා නිශ්චිත හා මැනිය හැකි ආකාරයන් හදුනා ගැනීමට අපහසු වන අතර පෙර පැවති තත්වය සමග දැනට පවතින තත්වය අඩුවිමක් හෝ වැඩිවීමක් ලෙස මැනිය හැකිය. |

සුසන්ත කහවත්ත,
අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව.

සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

ආචාර්ය බි.කේ.කෝලිත් කමල් ජිනදාස,
ලේකම්,
ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය.

ආචාර්ය බී.කේ. කෝලිත කමල් ජිනදාස
ලේකම්
ධීවර,ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
02 වන මහල නව මහලේකම් කාර්යාලය
මාලිගාවත්ත, කොළඹ 10

16/6/2026

රාමලිංගම් චන්ද්‍රසේකර්,
ගරු අමාත්‍ය,
ධීවර,ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය.

Ramalingam Chandrasekar (M.P.)
Minister of Fisheries, Aqautic and
Ocean Resources
New Secretariat Office, Maligawatta
Colombo 10.